# කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ජාත්‍යන්තර තත්ත්ව සහතික සඳහා රජයෙන් සහන - 2026

## ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් දේශීය කර්මාන්තවල ඵලදායීතාවය ඉහළ නැංවීම වෙනුවෙන් තත්ත්ව කළමනාකරණය වැඩිදියුණු කිරීම, පරිසර කළමනාකරණය ඉහළ නැංවීම, බලශක්ති කාර්යක්ෂමතාවය සහ ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම මගින් දේශීය නිෂ්පාදනවලට අපනයන වෙළඳපොළ තුළ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා විශේෂ අනුග්‍රහයක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා පහත සඳහන් සුළු කර්මාන්ත ක්ෂේත්‍රයන් හෝ 2026 ජනවාරි 01 දිනට වාර්ෂික පිරිවැටුම රු. මිලියන 675 ට අඩු සහ සේවක සංඛ්‍යාව 125 ට අඩු මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ඉහත ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබා ගැනීමට අයදුම් කළ හැකිය.

| | | |
|---|---|---|
| ● සැකසූ ආහාර නිෂ්පාදන | ● අගය එකතු කළ තේ ආශ්‍රිත නිෂ්පාදන | ● මැණික් හා ස්වර්ණාභරණ |
| ● අගය එකතු කළ කුළුබඩු නිෂ්පාදන | ● අගය එකතු කළ කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන | ● ඇසුරුම් නිෂ්පාදන |
| ● කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන | ● පාවහන්, සම්, සම් නිෂ්පාදන හා ආශ්‍රිත නිෂ්පාදන | ● රබර්, ප්ලාස්ටික් හා නිෂ්පාදන |
| ● ලෝහ, ඩයි සහ අච්චු, යන්ත්‍රෝපකරණ උපාංග හා ආශ්‍රිත නිෂ්පාදන | ● දැව, දැව ආශ්‍රිත නිෂ්පාදන හා ගෘහ භාණ්ඩ නිෂ්පාදන | ● මෝටර් රථ උපාංග හා ආශ්‍රිත නිෂ්පාදන |
| ● විදුලි, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් හා ආශ්‍රිත නිෂ්පාදන | ● බටහිර හා දේශීය ඖෂධ හා ආශ්‍රිත නිෂ්පාදන | ● ගැනයිට්, ටයිල්, මැටි, පිඟන් මැටි හා ගොඩනැගිලි ආශ්‍රිත නිෂ්පාදන |
| ● තීන්ත, රසායනික ද්‍රව්‍ය, මුද්‍රණ ද්‍රව්‍ය හා ආශිත නිෂ්පාදන | ● රූපලාවණ්‍ය ආලේපන හා ආශ්‍රිත නිෂ්පාදන | ● ඛනිජ ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන |
| ● ඇඟලුම්, රෙදිපිළි හා ආශ්‍රිත නිෂ්පාදන | | |

**ප්‍රතිලාභ :**

- තෝරාගත් කර්මාන්ත සඳහා උපරිමය රු. 200,000/- දක්වා සහතිකකරණ ගාස්තු ගෙවීම් කරන අතර සහතිකපත් හා බිල්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- රජයට අනුබද්ධ පිළිගත් ආයතනයකින් හෝ අමාත්‍යාංශ වෙබ් අඩවිය තුළ යාවත්කාලීන කරන ලද උපදේශක ආයතනයකින් උපදේශන සේවා ලබාගත්තේ නම් උපදේශන සේවා ගාස්තු උපරිමය රු.100,000/- දක්වා ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

**යෝග්‍යතාවය :**

- අවම වශයෙන් ආසන්න පසුගිය වසර 03ක කාලය තුළ නිෂ්පාදන කර්මාන්තයක් ලෙස පවත්වාගෙන තිබිය යුතුය (නිෂ්පාදන වාර්තා ඉදිරිපත් කළ යුතුය).
- ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක තත්ත්වයේ පැවතිය යුතුය.
- සම්මුඛ පරීක්ෂණය සිදුකරන අවස්ථාව වන විට අදාළ සහතික ලබාගැනීම සඳහා සහතිකකරණ සහ උපදේශන ආයතන වෙත අයදුම් නොකළ කර්මාන්තයක් විම අනිවාර්‍යය විය යුතුය.
- ඉහත සඳහන් සහතිකකරණ වැඩසටහන යටතේ පෙර වර්ෂවල කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගත් කර්මාන්ත සඳහා තෝරාගැනීමේදී මූලිකත්වය දෙනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලිය :**

- පුවත්පත් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසි සහ සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කර ගන්නා කරුණු මත තෝරා ගැනීම සිදුකෙරේ.

**අනෙකුත් කොන්දේසි :**

- ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) යටතේ ප්‍රතීතනය තරන ලද සහතිකකරණ ආයතනයකින් සහතික ලබා ගත යුතුය.
- තෝරා ගන්නා අයදුම්කරුවන් නියමිත දිනට ප්‍රථම තම ආයතනයේ සහතිකකරණ ක්‍රියාවලිය අවසන් කරන බවට අමාත්‍යාංශය සමග එකඟතා ගිවිසුමකට යටත් විය යුතුය.
- ලබාගන්නා ප්‍රමිති සහතිකය අවම වශයෙන් වසර 05ක් යන තෙක් අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.
- සහතිකපත් සහ බිල්පත් 2026 ඔක්තෝබර් 30 දිනට හෝ ඊට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර අදාළ සහතිකපත් ගාස්තු සහ උපදේශන ගාස්තු ප්‍රතිපූරණය කරගත යුතුය.
- දේශීය කර්මාන්තයක් විය යුතු අතර අවම වශයෙන් දේශීය හවුල්කරු 60% ක ආයතනයේ හිමිකම් දැරිය යුතුය.
- අදාළ කර්මාන්තය සහතිකකරණ ක්‍රියාවලිය සිදුවන කාලය තුළ වෙනත් රජයේ ආයතනයකින් මෙයට සමාන ප්‍රතිලාභ ලබා නොගත යුතුය.
- සමාගම් සමූහයක් ඇති ව්‍යාපාරයකින් මෙම වැඩසටහන සඳහා අයදුම් කළ හැක්කේ එක් සමාගමකට පමණි.

**අයදුම් කිරීම :**

පහත සඳහන් QR කේතය හෝ ගූගල් දිගුව මගින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2026 මාර්තු මස 27 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

**වැඩි විස්තර සඳහා :**

දුරකථන අංක – 011-2422319, 0112 392149
ලිපිනය – අධ්‍යක්ෂ, සංවර්ධන අංශ I,
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, 73/1, ගාලු පාර, කොළඹ 03.

Email – iso2023.mi@gmail.com / sector1mid@yahoo.com

**ලේකම්**
**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**
**73/1, ගාලු පාර, කොළඹ 03.**

**Google Form Link** https://forms.gle/LA2YRT7aWUhPJ6LWA